33 වන පිටෙන්

උවමනාවක් තියන කණ්ඩායමක් බලයට ආ-පුවම අර අගනුවර ආයෙත් වෙනස් වෙනවා. ඔය අගනුවර කියන සංකල්පෙට ඉංගිරිස් කාරයෝ හරි ලස්සන යෙදුමක් යොදනවා. ඒ තමයි “Seat of Power˜ * මට තේරෙන ඉංග්‍රීසියට අනුව නං ඒ කියන්නේ “බලයේ ආසනය” කියන එකයි. ඒ කියන්නේ බලය කේන්ද්‍රගත වෙලා තියන තැන.

ඉතිං ඔය වගේ මානව ඉතිහාසය ගත්තම ඉතා තාවකාලික සිදුවීමක් හිංදා මිනී මරා ගන්ඩ ඕනද? මට තියන ප්‍රශ්නේ ඒකයි.

මම බෞද්ධයෙක්. ඉතිං මම අනුරාධපුරේට හරි සැවත් නුවරට හරි, බුද්ධගයාවට හරි ලුම්බිණියට හරි ගියාම හිතෙනවා අනේ මේ අපි ඉන්නේ බුදු හාමුදුරුවෝ එහෙම නැත්තං රහත් උත්තමයෝ වැඩ හිටපු තැනක නේද? මේ මේ තැන් පහු කර ගෙන ඒ උත්තමයෝ වඩින්ඩ ඇති නේද? කියලා. ඔය ජේරුසෙලමේ මිනී මරා ගන්න එවුන්ට හිතෙන්නේ නැද්ද ඒ නගරේ පොලොව උඩ නේද ජේසු තුමා ශ්‍රාවකයොත් එක්ක වැඩියේ කියලා. මම ඉස්ලාම් ආගම ගැන දන්නේ නෑ හැබැයි නබිතුමා හෝ එතුමාගේ ප්‍රධාන අනුගාමිකයෝ හරි ජේරුසලමේ ඉන්න ඇති. යුදෙව් ආගමේත් ප්‍රධානියෝ ඔය නගරේ ඉන්ඩ ඇති. මේ හැමෝම තම තමුන්ගේ දෙවියන්ට කී පාරක් යාඥා කරලා ඇත්ද ඔය ශුද්ධ භූමියේ ඉදන්? මිනිස්සුන්ට යහපත උදා කරලා දෙන්ඩ ඔවුන් කොයිතරං වෙහෙස වෙන්ඩ ඇත්ද ඔය නගරේ ඉදන්. ප්‍රේමයේ පණිවිඩය දෙවියන් හා මිනිසුන් එක්කහු කරමින් කී පාරක් ගලා යන්ඩ ඇත්ද ඔය නගරේ ඉඳන්?

එහෙව් නගරයක්, ආගමක් නාමයෙන් අල්ලාගෙන මිනී මරා ගන්නේ ඇයි? බයිබලයේ ශුද්ධවර මැතිව් ගේ පොතේ මෙහෙම තියනවා.

**ජේසුස් වහන්සේ ඔවුන්ගේ නපුරු අදහස දැන, කෛරාටිකයෙනි, ඔබ මා පරික්ෂා කරන්නේ මන්ද? බදු ගෙවන කාසියක් මට පෙන්වන්නැයි වදාළ සේක. ඔවුහු රිදී කා-සියක් ගෙනැවිත් උන් වහන්සේගේ අතට දුන්හ. ලමේ රූපය හා සටහන කවරෙකුගේ දැල යි උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. ලසීසර් අධිරාජයාගේ යලයි ඔවුහු කීහ. එවිට උන් වහන්සේ, එසේ නම් රජුගේ දේ රජුටත්, දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්නැල යි වදාළ සේක. ඔවුහු ඒ අසා මවිතව උන් වහන්සේ අත්හැර ගියහ. (ශු. මැතිව් 22 15)**

ජේසුස් වහන්සේට තිබු ප්‍රඥාව උන් වහන්සේගේ වර්තමාන අනුගාමිකයන්ට තියනවනං ඔවුන් මිනී මරා ගන්න එකක් නෑ. නබි තුමාගේ හෝ යුදෙව් ආගමේ ඉගැන්වීම් ගැන මං දන්නේ නෑ හැබැයි මට හිතෙනවා ඔවුනුත් මීට සමාන දේවල් කියන්ඩ ඇති අනුගාමිකයන්ට. ඒත් ඒ එකක්වත් තේරුං නොගන්න අපි මිනී මරා ගන්නවා ජේරුසෙලම වෙනුවෙන්.

ජේරුසෙලම හරියට අම්ම කෙනෙක් වගේ. කවදාවත් කාටවත් අයිති කර ගන්ඩ හෝ විනාශ කරන්ඩ බැරි උතුම් සංකල්පයක්. මගේ අම්මා ජීවතුන් අතර නැති උනත් ඒ සුවඳ, ඒ හඬ මට තාම දැනෙනවා. මගේ හිතේ හැම දරුවෙකුටම එහෙමයි. ඒ වගේම ජේරුසෙලමත් කාටවත් කවදාවත් අයිති කර ගන්ඩ වත් නැති කරන්ඩ වත් බැරි සුන්දර සංකල්පයක්. මෙන්න සාක්කි. පහුගිය අවුරුදු හය දාහක කාලෙදි ඔය නගරය දෙපාරක් සම්පූර්ණයෙන් සමතලා උනා. හැබැයි ඊජිප්තු ෆීනික්ස් කුරුල්ලා වගේ අළු උඩින් ජේරුසෙලම නැගී හිටියා. සතුරන් විසින් 23 පාරක් සම්පූර්ණයෙන් වැටලුවා. පනස් දෙපාරක් ප්‍රහාරයන්ට ලක් උනා. 44 පාරක් එක එක පැති වලින් අල්ල ගත්තා. ඒ කියන්නේ 121 වතාවක් විනාසේ කර මුලටම ආවා. හැබැයි විනාස උනේ නෑ. ඔය කාලේ ඇතුලත අධිරාජ්‍ය කීයක් ඇතිවෙලා නැතිවෙලා ගියාද? ඉතින් මේ අමරණීය නගරයක් වෙනුවෙන් කෙටි ජීවිත කාලයක් තියන මිනිස්සු මිනී මරා ගන්න එක මොන තරං මෝඩ වැඩක්ද?

මට හිතෙන්නේ මේ ඇත්ත දැන් ඉන්න නායකයොත්, සාමාන්‍ය මිනිස්සුත් නොදන්නවා නෙවෙයි. අපේ මහා කවියා * මහගම සේකර මහත්තයා කියනවා වගේ ඔවුන් මෙහෙම හිතනවා ඇති.තවතව

**උදුරා දමා සිතෙන් පැරණි මතක**
**ඉදි කරමුව ඉදිරි දවස.**
**ඔවුහු කියති සිත ඇතුළෙන්**
**ඔවුනොවුන්ට.**
**තම තමන්ට.**
**එසේ වුව,**
**මතකයට වරින් වර ගලා එයි**
**අතීතයේ සුවඳ* දුගඳ**
**ඉන් නැත මිදුමක්.**
**සසඳා බලති ඔවුහු**
**එදත් * අදත්**
**උන්ගේ නියම සෙනෙහස මනිනා පඩිය**
**දැන් පැත්තට දමා බැලූ විට බර වැඩිය**

(මහගම සේකර * රාජතිලක, ලයනල් සහ ප්‍රියන්ත කවි පොතෙන්)

මෙහෙම මිනී මරා ගන්නවනං ශුද්ධ නගර වෙනුවෙන්, අපි ඔය ශුද්ධ නගර එක්කහු කරලා පොළොවෙන් එළියේ තැනක තියමු. ඊට පස්සේ ආරියවංශ රණවීර කවියා කියනවා වගේ මෙහෙම කියමු.

**ඔබ ඉන්න ඔතන පිටතම**
**උස වැඩියි ගන්න ගෙතුළට**
**මිටි මිටි දෑය ඇත්තෙ ඇතුළත**
**උස ඔබට කොහොමවත් නොගැළෙපෙන**

**කතා කුණු වැකුණු රෙදි පෙරෙදි වෙයි**
**කට දිගේ හොදි පෙරුණු බඳුන් වෙයි**
**නොසරුප් වදන් එහෙ මෙහෙ වදියි**
**නොගැඹුරු අකුණු හිස මත කෙටෙයි**

**ඔබ ඉන්න ඔතන පිටතම**
**මහා අකුණු ආවද නොසැළෙන**
**පත් කිරුළු පානා රජෙකු සේ**
**නෙක රැස් ප්‍රභා අවට විහිදමින්**

**මම පැමිණ වරින් වර පිටතට**
**ඔබ අසළ සෙවන යට වැතිර ගෙන**



**විඳි සුවය හද මැදුර දරා ගෙන**
**හොදි බඳුන් සෝදමි ගෙට පැමිණ**
**කැත කුණු ද සෝදමි ගෙයි වැකුණ**

**ඔබ ඉන්න ඔතන පිටතම**
**උස වැඩියි ගන්න ගෙතුලට**

(ආරියවංශ රණවීර, කණිකා * කවුළුවට අතු අගින් අනින ගෙන් පිටත උස ගසට)

එහෙම නැත්තං ඔක්කොම එක්කහු වෙලා මෙහෙම ප්‍රතිඥා දෙන්ඩ ඕන ජේරුසෙලමේ උපදින අනාගත පරම්පරාවට. ඔය අපේ ලංකාවේ නායකයෝ උදේ දවල් බොරුවට දෙනවා වගේ නෙවෙයි හදවතිම්ම. ප්‍රතිඥාව දැනටම ලියල මහගම සේකර.

**යගදා දෑතින් සවිබල මිරිකා**
**මවු පොළොවේ පස එයින් හනා**
**පුතුනේ හෙට ඔබ දොරට වඩින විට**
**ගොඩ නංවන්නෙමු අලූත් ලොවක් අපි**
**ආදරයෙන් පිරි අලූත් ලොවක්**
**.......**
**අතීත උරුමය පාදා මතුකොට**
**නව යුගයේ නව හුස්මෙන් පණ පිඹ**
**යළි නොවැටෙන ලෙස**
**ඒ ගල් ටැම් මත**
**ගොඩ නංවන්නෙමු අලූත් ලොවක්**
**සන්තෝෂය පිරි අලූත් ලොවක්෴**

(මහගම සේකර, නොපළ ගීත * ගොඩ නංවන්නෙමු අලූත් ලොවක් අපි)

ජේරුසලමේ විතරක් නෙවෙයි ලංකාවේ අනාගත පරපුරටත් මේ පොරොන්දුව දෙමුද අපි?

ආදරයෙන් පිරි අලූත් ලොවක්

සන්තෝෂය පිරි අලූත් ලොවක්෴

http://kattakaduwa.blogspot.com.au/


# දඹදිව
සියලු පහසුකම් සහිත සුඛෝපභෝගී
විශේෂ දඹදිව වන්දනා චාරිකා *
බුද්ධගයා, රාජ්ගිර්, වෛශාලි, කුෂිනගර්,
ලුම්බිණි / කපිලවස්තු, ශ්‍රාවස්ථි, වරණාසි
CHARIKA TRAVELS

**Special Pilgrimages for Dambadiva***

• Smaller Groups (ideal for families & friends) • 09 or 10 days Tours • Star Class Hotel Accommodation • Air-conditioned comfortable Vehicles (No Train travel) • Customised Tours if necessary *

* Terms & Conditions Apply. Minimum number of Passengers per group apply

Contact us for details

www.charikatravels.com/dambadiva

Tel: (03) 8804 1488

Email: tours@charikatravels.com

Celink Australia Pty Ltd trading as CHARIKA TRAVELS